# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } RG/NB/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battharamulla.

දිනය / திகதி / Date } 2022.08. 18


චක්‍රලේඛ අංක : 11/2022

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>රජයේ ඉඩම් සඳහා නොතාරිස් ඔප්පු සකස් කිරීම.</u>

රජයේ ඉඩම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මා විසින් මීට පෙර නිකුත් කර ඇති රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක චක්‍ර 03/2010 සහ 2010.06.14 දිනැති චක්‍රලේඛය, අංක RG/NB/1/චක්‍රලේඛ හා 2020.11.05 සහ අංක RG/NB/01/19 හා 2022.05.04 දිනැති ලිපි හා බැඳේ. එම චක්‍රලේඛ සහ ලිපි මෙයින් අවලංගු කරන අතර 2022.09.01 දින සිට ඉහත කරුණ සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයෙහි සඳහන් නියෝග බලපැවැත්විය යුතු බව දන්වා සිටිමි.

02. මෑතක සිට රජයේ ඉඩම් සඳහා ව්‍යාජ ලෙස නොතාරිස් ඔප්පු සකස් කර ලියාපදිංචි කර ගැනීමේ ප්‍රවණතාවක් පවතින බවත් එම හේතුව නිසා බරපතල ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදුවී ඇති බවත් විවිධ රජයේ ආයතන විසින් මා වෙත දන්වා ඇත. රජයේ ඉඩම් සඳහා ව්‍යාජ ලේඛන ලියාපදිංචි කිරීම පිළිබඳව විගණකාධිපතිගේ සහ රජයේ ගිණුම් කාරක සභාවේ අවධානය ද යොමු වී ඇත. එවැනි නීති විරෝධී ක්‍රියාවන් තවදුරටත් සිදුවීම වැළැක්වීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ගත හැකි උපරිම ක්‍රියාමාර්ගයන් ගැනීම කාලීන මෙන්ම ජාතික අවශ්‍යතාවයක් ද වී ඇත. එබැවින් ලේඛන ලියාපදිංචි කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන ලෙස දන්වමි.

(අ) ලියාපදිංචිය සඳහා ඔබ වෙත ලැබී ඇති ඔප්පුවේ සඳහන් ඉඩම හෝ ඉඩම්, රජයේ ඉඩමක් නොවන බවට සෑහීමට පත්වීමෙන් පසුව පමණක් ලියාපදිංචියට පියවර ගැනීම.

(ආ) එම ඉඩම සම්බන්ධව මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු අදාළ වේ නම් එම ඔප්පුවේ පිටපතක් ද සමඟ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් මේ පිළිබඳව විමසීමක් කිරීම.

(ඇ) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එය රජයේ ඉඩමක් බව දැනුම් දුනහොත් එම ලේඛනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමටත්, රජයේ ඉඩමක් නොවන බැව් දන්වා සිටියහොත් එය ලියාපදිංචි කිරීමටත් පියවර ගැනීම.

(ඈ) ඔබ වෙත ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන ලේඛනවල ඇති ඉඩම් රජයේ ඉඩමකට, මුහුදු වෙරළකට, රැම්සාර් තෙත්බිම්වලට, ස්වභාවික රක්ෂිත වනාන්තරවලට, වාරිමාර්ග හෝ වැව් රක්ෂිතවලට, ඇළ මාර්ග දෙපසට හෝ රජය විසින් ප්‍රකාශිත ආවේක්ෂණ කලාපයකට මායිම් වන්නේ නම් ඒ සියලු අවස්ථාවන්හීදී එම ඉඩම පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීම හා ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දෙන නිරීක්ෂණ මත පමණක් එවැනි ලේඛන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සහ එම ඉඩම රජය සතු දේපළක් බවට ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශය ලබා දෙන්නේ නම් අදාළ ලේඛනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම.




දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. } 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.rgd.gov.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk rg@rgd.gov.lk

03. ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් මේ සම්බන්ධව සිදු කරන විමසීම් සඳහා ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන්, පිළිතුරු ලබා නොදෙන බවත්, සමහර අවස්ථාවල පිළිතුරු ලබා දීමට බොහෝ කාලයක් ගන්නා බවත් මා වෙත වාර්තා වේ. ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් අදාළ ඉඩම රජය සතු වන්නේද යන්න පිළිබඳව පිළිතුරු ලබා දීමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරන අවස්ථා ද වේ. ප්‍රාදේශීය ලේකම්ගෙන් පිළිතුරක් ලැබෙන තෙක් අදාළ ලේඛන, ලියාපදිංචි නොකර තබා ගැනීම සිදු කරන අතර එම හේතුව නිසා ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු ද ප්‍රමාද වේ. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. මාස 03ක් ඇතුළත පිළිතුරු නොලැබෙන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව අදාළ ලේඛනය ලියාපදිංචි කිරීමට කටයුතු කරන බවට ප්‍රාදේශීය ලේකම් වෙත මුල් අවස්ථාවේදීම දැනුම් දීම.
II. අදාළ ඉඩම රජය සතු ඉඩමක් ද යන්න පිළිබඳව මාස 03ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් විසින් පිළිතුරක් නොඑවන්නේ නම් එකී ලේඛනය ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.
III. පිළිතුරු ලබාදීමට යම් කාලයක් අවශ්‍ය බව ප්‍රාදේශීය ලේකම් දන්වා සිටින්නේ නම් ඒ සඳහා අවශ්‍ය කාලය ලබා දීම.

ඉහත දක්වා ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඔබගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වන අතර ඉහත පරිදි කටයුතු නොකිරීම, විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හේතු වනු ඇත.

04. යම් නොතාරිස්වරයෙකු විසින් දිගින් දිගටම රජයේ ඉඩම් සඳහා ලේඛන ලියා සහතික කරන්නේ නම් ඔහු පිළිබඳව ප්‍රධාන කාර්යාලයේ නොතාරිස් අංශය දැනුවත් කිරීමට ද කටයුතු කළ යුතුය.

පී.එස්.පී. අබේවර්ධන

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 01. අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් - කරු. දැ.ගැ.ස.

02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස.

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු. දැ.ගැ.ස.

04. සියලුම කලාප භාර සියළුම නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස

05. සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු. දැ.ගැ.ස.

06. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරු. දැ.ගැ.ස.